# සංඛ්‍යාංක යුගයේ සංහතික සන්නිවේදන මාධ්‍ය ගෝලීයකරණයේ විශේෂතා



**ආචාර්ය ටියුඩර් වීරසිංහ**

මෙම ලිපියේ මූලික අරමුණ වන්නේ සංඛ්‍යාංක යුගයේ සංහතික සන්නිවේදන මාධ්‍යයේ ගෝලීයකරණයේ විශේෂතා රූපවාහිනී මාධ්‍යයට අදාළ ව සොයා බැලීම ය. 21 වන සියවස රූපවාහිනී මාධ්‍ය ක්ෂේත්‍රයේ සුවිශාල විපර්යාසයන් සිදුවන සියවසක් ලෙස සැලකිය හැකි ය. 20 වන සියවස තුළ දී මානව වර්ගයා සිය සමාජ පරිණාමයෙහි ගෝලීය අවධියට ප්‍රවිශ්ට වූ අතර, 21 වන සියවස මානව ඉතිහාසයට සම්බන්ධ වන්නේ සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධතිය සිය පරිණාමයේ සංඛ්‍යාංක යුගයට ප්‍රවිශ්ට වීමේ සියවසක් ලෙස ය.

අද්‍යතන සංඛ්‍යාංක තාක්ෂණයේ වර්ධනය සහ ව්‍යාප්තිය දෙස බලන විට එය රූපවාහිනිය ඇතුළු සංහතික මාධ්‍ය පද්ධතියේ ක්‍රියාකාරිත්වය කෙරෙහි පමණක් නොව, සමස්ත මානව සත්තාව, පැවැත්ම කෙරෙහි සුවිශාල වූ ද, බරපතල වූ ද බලපෑමක් සිදුකරන බව පෙනේ.



ලෝකය මීට දශක කීපයකට පෙර විඥාපනික වශයෙන් හුදකලාව පැවතිණි. විශේෂයෙන් සංඛ්‍යාංකකරණය ගෝලීයකෘත සංහතික විඥාපන (තොරතුරු) අවකාශයක් නිර්මාණය කිරීමට ආවශ්‍යයික තාක්ෂණික පදනම නිර්මාණය කළේ ය. මානව වර්ගයාගේ සමාජ පරිණාමයෙහි ප්‍රතිඵලයක් ලෙස බිහි වූ ධනවාදය, ලිබරල්වාදය, සංහතික මාධ්‍ය හා සංඛ්‍යාංක තාක්ෂණය ප්‍රාරම්භක වශයෙන් ම ගෝලීයකෘත ස්වභාවයක් දරන්නා වූ ප්‍රපංචයන් බව පෙන්වාදිය යුතු ය. වර්තමානය වන විට එම ප්‍රපංචයන් ගෝලීයකෘත පරිමාණයක් දක්වා පමණක් නොව, මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ උපරි සමාජයක් බිහි කර ඇත. විශේෂයෙන් මානව සමාජයේ විඥාපන, තොරතුරු සන්නිවේදන මාධ්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රසාරණය සහ වර්ධනය මානව සමාජ සත්තාවේ නව ගුණයන්, නව මානයන්, නව ගතික හා ප්‍රවණතා ප්‍රකට කරමින් පර්යේෂකයින් අභියස අලුත් පර්යේෂණ ඉසව් රාශියක් විවෘත කර තිබේ.

විශේෂයෙන් රූපවාහිනී ක්ෂේත්‍රය තුළ සිදුවන සංඛ්‍යාකරණ ක්‍රියාවලිය රූපවාහිනියෙහි තාක්ෂණික පැතිකඩ කෙරෙහි පමණක් නොව, එහි ක්‍රියාවලියේ සමස්තයට ම බලපාන්නේ ය. එය රූපවාහිනී පද්ධතිවල ගුණාත්මක තාක්ෂණික සහ තාක්ෂණවේදී අංශවල වර්ධනය පමණක් නොව, රූපවාහිනියේ ආර්ථික, දේශපාලන, කළමනාකරණ, නිර්මාණාත්මක, කලාත්මක, ප්‍රේක්ෂක නෛතික, සදාචාරාත්මක ආචාරධර්මීය, දෘශ්‍ය සෞන්දර්යාත්මක දෘෂ්ටිවාදී, ආධ්‍යාත්මික ආදී මානව පැවැත්මෙ සකලවිධ ක්ෂේත්‍ර කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදුකරන්නේ ය.

මිනිසා යථාර්ථය සමඟ සම්බන්ධ වීමෙ සහ යථාර්ථය පරාවර්තනය කිරීමේ මෙන් ම යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමෙ මාධ්‍යයන් කොතෙකුත්, සිය සමාජ - සංස්කෘතික පරිණාමීය ක්‍රියාවලිය තුළ දී උපයෝගී කරගත්තත්, ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයක් ලෙස රූපවාහිනිය තරම් ප්‍රබල මාධ්‍යයක් මානව වර්ගයා දැන නොසිටියේ ය.

සංඛ්‍යාංක රූපවාහිනියේ සම්භවය සහ වර්ධනය අවධි කීපයකට බෙදා දැක්විය හැකිය. ඒ සෑම අවධියක දී ම විද්‍යාත්මක

පර්යේෂණාත්මක සහ ආනුභවික නිර්මාණාත්මක කාර්යයන් සමඟ සම්බන්ධ ව පවතී.

සංඛ්‍යාංක රූපවාහිනියේ වර්ධනයේ පළමු වැනි අවධියේ දී නාලිකා සම්ප්‍රේෂණ සම්බන්ධතාවන්ගේ වියෝජන සහ ප්‍රතිසම සාමාන්‍ය ප්‍රමිතියේ සීමාව තුළ සිදුවිය. රූපවාහිනි පද්ධතිවල එක් එක් අංශ සඳහා සංඛ්‍යාංක තාක්‍ෂණික උපකරණවල වර්ධනය මේ අවධියේ කැපී පෙනෙන ලක්‍ෂණයකි. එනම් සංඛ්‍යාංක ශාලිකා උපකරණ බිහිවීමයි. වර්තමාන රූපවාහිනී නාලිකා තුළ කැමරාවෙන් සම්ප්‍රේක්‍ෂණය වන්නා වූ සංඥා සංඛ්‍යාංක ස්වරූපයට පරිවර්තනය වන අතර, ඒවායේ ඉදිරි සකස් කිරීම සහ සංරක්‍ෂණය කිරීම රූපවාහිනී මධ්‍යස්ථානයන්හි සංඛ්‍යාංක මාධ්‍යයෙන් සිදු කෙරේ. ඉහත ගෙන හැර දක්වන ලද සංඛ්‍යාංක රූපවාහිනියේ බොහෝ ප්‍රමුඛ ලක්‍ෂණ සැබෑවක් බවට පත්කර ගැනීමට ඉන් හැකියාවක් ලැබේ. එසේ ම සංඛ්‍යාංක රූපවාහිනියේ පළමු අවධියේ තවත් සැලකිය යුතු ප්‍රවණතාවක් වන්නේ රූපවාහිනී දර්ශනවල, රූප දර්ශනවල නිරූපණ හෝ ප්‍රකාශන ශක්‍යතා උසස් ගුණාත්මක තත්ත්වයකට ගෙන යෑමේ අරමුණින් යම් යම් සංඛ්‍යාංක උපකරණ රූපවාහිනී යන්ත්‍රවලට සවි කිරීමයි. මේ තත්ත්වය තුළ රූප දර්ශනවල ශබ්දයේ සුපැහැදිලිතාව සහ තීව්‍රතාව ඉහළ යන්නේ ය. නමුත්, මේ සියලු වර්ධනයන් තවමත් නාලිකා සම්බන්ධතා ඔස්සේ රූපවාහිනී සංඥා සම්ප්‍රේක්‍ෂණයේ වියෝජන මූලධර්ම ස්පර්ශ නොකරන්නේ ය.

සංඛ්‍යාංක රූපවාහිනියේ ඓතිහාසික විකාශනයේ දෙවැනි අවධිය තුළ දැනට ක්‍රියාත්මක ප්‍රමිතිගත සාමාන්‍යය රූපවාහිනියට වඩා වෙනස් වූ ප්‍රමිතීන් සහිත දෙමුහුන් ප්‍රතිසම - සංඛ්‍යාංක රූපවාහිනී පද්ධති නිර්මාණය වන්නේ ය. රූපවාහිනී ප්‍රමිතියේ වෙනස්වීම් මූලික ප්‍රවණතා දෙකක් වෙන්කර හඳුනාගත හැකි ය. දීප්තතාව සහ වර්ණ පරාස සංඥා එක්වර සම්ප්‍රේක්‍ෂණයේ සිට අනුක්‍රමික සම්ප්‍රේෂණය දක්වා පරිවර්තනය සහ රූප දර්ශනයෙහි පේළි ගණන සහ පේළියෙහි නිරූපණ සංඝටක ප්‍රමාණය වර්ධනය වීම ඉන් පළමුවැනි ප්‍රවණතාව වන අතර, දෙවන ප්‍රවණතාව වන්නේ නාලිකා ඔස්සේ පූර්ණ සංඛ්‍යානයකින් සම්ප්‍රේක්‍ෂණය කිරීම සහතික කිරීම සඳහා රූපවාහිනී සංඥා සම්පිණ්ඩනය



කිරීමේ අවශ්‍යතාවයි. දෙමුහුන් රූපවාහිනී පද්ධති සඳහා නිදර්ශන වශයෙන් අධි විස්තාරිත ජපන් රූපවාහිනී ක්‍රමය MUSE සහ MAC පවුලට අයත් බටහිර යුරෝපීය රූපවාහිනී ක්‍රමය ගෙන හැර දැක්විය හැකි ය. මෙම සියලු ම රූපවාහිනී පද්ධතිවල සම්ප්‍රේෂණ සහ ප්‍රතිග්‍රාහක කොටස් තුළ සංඥා පිරිසැකැස්ම සිදුවන්නේ සංඛ්‍යාංක මාධ්‍යයන් මඟින් වන නමුත් නාලිකා සම්බන්ධතා වන්නේ, සංඥා සම්ප්‍රේක්‍ෂණය සිදුවන්නේ ප්‍රතිසම ස්වරූපයෙනි.

සංඛ්‍යාංක රූපවාහිනියේ ඓතිහාසික පරිණාමයේ තුන්වැනි අවධිය පූර්ණ සංඛ්‍යාංක රූපවාහිනී පද්ධති නිර්මාණය කිරීම හා සම්බන්ධ වේ.

අප ඉහත සඳහන් කරන ලද ජපාන සහ යුරෝපා අධි විස්තාරිත රූපවාහිනී පද්ධති බිහි වූවාට පසු ව, අමෙරිකා එක්සත් ජනපදය 1987 දී ජාතික ප්‍රමිතියෙන් හොඳ ම අධිවිස්තාරිත රූපවාහිනී පද්ධතියක් සඳහා ව්‍යාපෘතියක් ප්‍රකාශනයට පත් කළේ ය. මෙහි දී ද සැලකිල්ලට ගන්නා ලද්දේ අධිවිස්තාරිත ප්‍රතිසම රූපවාහිනී පද්ධතියක් සඳහා වූ ව්‍යාපෘති වන අතර එහි විශේෂත්වය වූයේ එක ම ප්‍රමිතක නාලිකාවක් ඔස්සේ සාමාන්‍ය සංඥා මෙන් ම අතිරේක සංඥා ද සම්ප්‍රේෂණය කළ හැකිවීම ය. තව වසර කීපයක දී සම්පූර්ණයෙන් ම සංඛ්‍යාංක සංඥා සම්ප්‍රේක්‍ෂණය කිරීමට හැකි වේ යැයි කිසිවකු අපේක්‍ෂා නොකළේ ය.

සංඛ්‍යාංක රූපවාහිනියේ වර්ධනයේ ඉතිහාසය තුළ සම්පිණ්ඩිත රූපවාහිනී සංඥා නිරූපණය කොතෙක් දුරට අභියෝගාත්මක කර්තව්‍යයක් වූවා දැයි ප්‍රකාශ කරනවා නම් එම ගැටලුව විසඳීමේ කාර්ය ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධානය මඟින්, තමා වෙත එහි සම්බන්ධීකරණ කාර්ය පවරා ගන්නා ලදි. සම්පිණ්ඩිත රූපවාහිනී නිරූපණ සම්ප්‍රේක්‍ෂණය සහ සංරක්‍ෂණය එතරම් සක්‍රීය සහ වැදගත් ප්‍රශ්නයක් වූ බව සඳහන් කළ යුතු ය. ඩිජිටල් සංඛ්‍යාංක රූපවාහිනී මුල් අවධියේ දී සම්මත ප්‍රමිතීන් නිර්මාණය වී නොතිබීම නිසා ඇනලොග්; ඩිජිටල් (ප්‍රතිසම සංඛ්‍යාංක) බවටත්, ඩිජිටල්; ඇනලොග් (සංඛ්‍යාංක ප්‍රතිසම) බවටත් පරිවර්තනය කිරීම එක් එක් ආකාරයට කිරීම නිසා

නොයෙකුත් ප්‍රශ්න ඇතිවිය. (හෙට්ටිආරච්චි - 2014) මේ අභියෝග ජය ගැනීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය විශේෂඥ කණ්ඩායම් දෙකක් පත් කළේ ය. ඉන් එක් සංවිධානයක් Joint Picture Expert Group (JPEG) වූ අතර, දෙවන කණ්ඩායම Motion Picture Expert Group (MPEG) විය. පළමු කණ්ඩායමේ කාර්යභාරය වූයේ අචල ප්‍රතිරූපීය සම්පිණ්ඩනයේ ක්‍රම සැකසීම වන අතර, දෙවැනි කණ්ඩායමේ කාර්යභාරය වූයේ චලනීය ප්‍රතිරූපය සහ ඊට සමගාමී ශබ්ද සම්පිණ්ඩන ක්‍රම සැකසීමයි. වර්තමාන සංඛ්‍යාංක රූපවාහිනියේ පදනම නිර්මාණය කිරීම සඳහා MPEG කණ්ඩායමේ සොයාගැනීම් ඉවහල් වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

අමෙරිකා එක්සත් ජනපදය 1987 දී දියත්කර තිබූ ජාතික ප්‍රමිතියෙන් යුත් හොඳ ම අධිවිස්තාරිත රූපවාහිනී ව්‍යාපෘතිය වෙත 1990 වන විට සම්පූර්ණ සංඛ්‍යාංක රූපවාහිනී පද්ධතියක් සඳහා අදහස් ප්‍රථම වරට ඉදිරිපත් විය.

අනාගත රූපවාහිනියේ ඉරණම සංඛ්‍යාංක තාක්‍ෂණය මත පදනම්වනවා ය යන අදහස යුරෝපා සමාජයට ද ඇනෙන්නට වූ අතර, 1993 වන විට යුරෝපය DVB (Digital Video Broadcasting) 'සංඛ්‍යාංක රූප දර්ශන විකාශය' ව්‍යාපෘති ආරම්භ කළේ ය. 21 සියවසේ ප්‍රථම දශකය තුළ දී ප්‍රතිසම රූපවාහිනී විකාශ ක්‍රම සම්පූර්ණයෙන් ම නවතා දමා සංඛ්‍යාංක රූපවාහිනී විකාශන පද්ධතිවලට පරිවර්තනය වීම සනිටුහන් කළේ ය.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ සංඛ්‍යාංක යුගයෙහි රූපවාහිනියේ පරිණාමයේ තාක්‍ෂණික සහ තාක්‍ෂණිකවේදී පැතිකඩ සලකා බැලීම නොවේ. රූපවාහිනිය ප්‍රධාන වශයෙන් තාක්‍ෂණික සහ සංස්කෘතික ප්‍රපංචයකි.

සමකාලීන රූපාවාහිනිය යනු සංහතික විඥාපන ක්‍රියාවලියෙහි සංශ්ලේෂීය පද්ධතියකි. එනම්, රූපවාහිනිය තාක්‍ෂණික හා ක්‍ෂණිකවේදී, නිර්මාණාත්මක, කලාත්මක, දෘෂ්ටිවාදී හා මානවවාදී පැතිකඩ මඟින් නිර්මිත වන්නා වූ පදනමක් මත පිහිටා විඥාපනික සහ දෘෂ්ටිවාදී පඨිත නිපදවීමේ සාමූහික ක්‍රියාවලියකි. මේ සමකාලීන රූපවාහිනිය සංයුක්ත,



නිර්මිත කරන සියලු පැතිකඩ අපොහකාත්මක සම්බන්ධතාවක ක්‍රියාකරමින් සංහතික මාධ්‍යවේදාත්මක රූපවාහිනී පඨිත නිර්මාණය කෙරෙහි ප්‍රගමනාත්මක හෝ අවගමනාත්මක සහ සාධනීය හෝ නිෂේධනීය බලපෑමක් සිදුකරනු ලබයි. රූපවාහිනී මාධ්‍යවේදයේ නිර්මාණාත්මක අවශ්‍යතා සහ රූපවාහිනියේ තාක්‍ෂණික ශක්‍යතා අතර ප්‍රතිරෝධතාව රූපවාහිනී තාක්‍ෂණයේ ඉදිරි වර්ධනයට පමණක් නොව, රූපවාහිනී පඨිත සහ ප්‍රභේද ව්‍යුහයේ ගුණාත්මක වර්ධනය ද උත්තේජනය කරන්නේ ය. එසේ ම රූපවාහිනී තාක්‍ෂණයේ වර්ධනය එහි නිරූපණ සහ ප්‍රකාශන ශක්‍යතාව තියුණු කිරීමට බලපාන අතර ම එසේ ම එය රූපවාහිනී මාධ්‍යවේදීන්ගේ නිර්මාණාත්මක පරිකල්පනය සහ නව ප්‍රභේදන ස්වරූප බිහිවීමට ආවශ්‍යයික පරිසරය ද ගොඩනගන්නේ ය. රූපවාහිනියේ සහ රූපවාහිනී මාධ්‍යවේදයේ මුළු ඉතිහාසය තුළ එය ඉතා හොඳින් නිරීක්‍ෂණය වන බව පෙන්වා දිය යුතු ය.

ඒ අනුව රූපවාහිනිය තාක්‍ෂණික සංස්කෘතික ප්‍රපංචයක් ලෙස විග්‍රහ කර බැලීම එහි අලුත් ගතික සහ ප්‍රවණතා අවබෝධ කර ගැනීම සඳහා මාවත විවෘත කරන්නේ ය.

අවසාන දශක කීපය තුළ සංහතික මාධ්‍ය සන්නිවේදන ක්‍රියාවලියේ සිදුවූ ව්‍යුහාත්මක වෙනස්වීම් සෑමට ම කලින් තාක්‍ෂණික ක්‍ෂේත්‍ර මත පදනම් වී ඇති බව ප්‍රත්‍යක්‍ෂ වන්නේ ය. විද්‍යුත් මාධ්‍ය කර්මාන්තයේ වර්ධනයත් සංහතික මාධ්‍ය ප්‍රභේදන වර්ණාවලියේ සහ නිරූපණ සහ ප්‍රකාශන මාධ්‍යයන්ගේ වර්ධනයට සෘජු ලෙස ම බලපාන්නේ ය.

විශේෂයෙන් අභිසාරීකරණයට, ඒකාග්‍රතාකරණයට, අනුකලනයට සහ අන්තර්ක්‍රියාකාරීත්වයට පාදක වන සමකාලීන සංඛ්‍යාංක තාක්‍ෂණික වර්ධනයත් විඥාපන සන්නිවේදනාත්මක අවකාශය වෙනස් කරමින් රූපවාහිනී පඨිතවල සන්ධාරයේ සහ සන්දර්භයේ අන්තර්ගතයේ සහ ආකෘතියේ සහසම්බන්ධතාව පිළිබඳ ප්‍රශ්නය තීව්‍ර කරන්නේ ය. මෙය සමකාලීන රූපවාහිනී වෘත්තිකයින් රූපවාහිනියේ සංඛ්‍යාංක යුගයේ දී මුහුණ දෙන ගැටලුවකි. එනම්, ගැටලුව වන්නේ සංඛ්‍යාංක තාක්‍ෂණයේ දැවැන්ත නිරූපණ සහ ප්‍රකාශන ශක්‍යතා භාවිත කරමින්

රූපවාහිනී පඨිතයේ අන්තර්ගත හෝ සන්ධාරය නිර්මාණය කරන්නේ කෙසේ ද යන්නයි. මේ නිසා ශ්‍රී ලාංකේය රූපවාහිනිය සංඛ්‍යාංකකරණය කිරීමේ දී එහි වැඩසටහන් ප්‍රභේදන ව්‍යුහය (වීරසිංහ, 2014) කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කළ යුතු වන්නේ ය. රූපවාහිනී වෘත්තිකයින් අභියස මතුවන අභියෝගය වන්නේ ඉහළ තාක්ෂණික සහ සංඛ්‍යාංක තාක්ෂණික නිරූපණ සහ ප්‍රකාශන ශක්‍යතා යොදා ගනිමින් ඉහළ කලාත්මක, සෞන්දර්යාත්මක සහ මානවවාදී රූපවාහිනී පඨිත නිර්මාණය කරන්නේ කෙසේ ද යන්නයි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රූපවාහිනී (ප්‍රතිසම රූපවාහිනී) පද්ධති සංඛ්‍යාංකකරණය කිරීමේ දී මතුවන වැදගත් ම ප්‍රශ්නය එය වුවත් එය ඊට පමණක් සීමා නොවේ. සාමාන්‍ය රූපවාහිනිය (ප්‍රතිසම රූපවාහිනිය) පද්ධතියක් දක්වා පරිවර්තනය කිරීම යනු සාමස්තික සංකීර්ණ ක්‍රියාවලියකි. එය දේශපාලන ආර්ථික, තාක්ෂණික කළමනාකරණ, ප්‍රේක්ෂාගාරික සහ නිර්මාණාත්මක සාධක සමඟ බැඳී පවතී.

සාමාන්‍ය සංහතික සන්නිවේදන මාධ්‍ය අවකාශය සංඛ්‍යාංකකරණයට පරිවර්තනය කිරීම මහ පරිමාණ හා පද්ධතිමය ගති ලක්ෂණ ද ප්‍රකට කරන අතර, එය මානව සම්බන්ධතා, සමාජ සම්බන්ධතා, ආධ්‍යාත්මික සම්බන්ධතා කෙරෙහි පමණක් නොව, සමස්ත මානව සත්තාව කෙරෙහි ද බලපාන බව අපගේ අදහසයි. එම නිසා මෙම ගැටලුවේ පුළුල් වූ ද ගැඹුරු වූ ද දෘශ්‍යයික පැතිකඩක් ද තිබේ. මෙහි ද අප සලකා බැලිය යුතු මූලික ප්‍රශ්නයක් වන්නේ සංඛ්‍යාංක ප්‍රකාශන හෝ නිරූපණ මාධ්‍යයන් යථාර්ථයට දක්වන සම්බන්ධතාවේ ස්වභාවය සහ ස්වරූපය කුමක් ද යන්න ය.

විඥාපන සන්නිවේදන මාධ්‍ය ක්‍රියාවලියට සංඛ්‍යාංක තාක්ෂණය සහ එහි ක්‍රමවේද ඇතුළුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සාම්ප්‍රදායික මාධ්‍ය, සන්නිවේදන සංකල්ප, ආකෘති අර්බුදයට යන්නේ ය. එසේ බොහෝ සම්භාව්‍ය සන්නිවේදන සහ මාධ්‍ය න්‍යායන් හා සංකල්ප මඟින් තවදුරටත් සංඛ්‍යාංක විඥාපන සන්නිවේදන මාධ්‍ය අවකාශය පැහැදිලි කිරීමට නොහැකි වන්නේ ය.



සමකාලීන සංඛ්‍යාංක තාක්ෂණය මත පදනම් වූ සංහතික මාධ්‍ය පඨිත අභිසාරීකරණ ක්‍රියාවලිය අලුත් ශ්‍රව්‍ය-දෘශ්‍ය සංහතික මාධ්‍ය සංස්කෘතිය, කරා පරිවර්තනය වීම නිසා ප්‍රේක්ෂාවේ නව ස්වරූප නිර්මාණය වීම ද ප්‍රේක්ෂක වරණීය ශක්‍යතාව සහ පරාසය ද වර්ධනය වන්නේ ය.

මෙහි දී අප සලකා බැලිය යුතු වන්නේ සංඛ්‍යාංක රූපවාහිනිය හුදු තාක්ෂණික මෙවලමක් හෝ උපකරණයක් වශයෙන් පමණක් හෝ සංඛ්‍යාංක තාක්ෂණික ස්වරූපය රූපවාහිනියට හෝ ශ්‍රව්‍ය-දෘශ්‍ය සංහතික මාධ්‍යයට හෝ සීමා වූවක් වශයෙන් ද නොව, සංඛ්‍යාංකකරණය සමකාලීන මානව සමාජ පරිණාමයේ සුවිශේෂ තත්ත්වයක්, මට්ටමක් මෙන් ම සමාජ - සංස්කෘතික පරිණාමයේ අධිපත්‍යයික ප්‍රවණතාවක් වශයෙනි. මේ අනුව සංඛ්‍යාංකකරණය මානව සංස්කෘතියේ පරිණාමයේ නව ගුණයක්, නව තලයක්, නව සම්බන්ධතා නිර්මාණය කිරීමට සමත් ප්‍රපංචයක් ලෙස හඳුනාගත යුතු ය. එය මානව සත්තාවේ අලුත් රූපයක් හා මට්ටමක් වශයෙන් සලකා බැලිය යුතු අතර, ඊට මිනිස් පැවැත්මේ මානසිකත්ව පැතිකඩ පමණක් නොව, ආර්ථික සහ රාජ්‍ය පැතිකඩ ද ඇතුළත් වන බව සඳහන් කළ යුතු ය. ඒ අනුව සංඛ්‍යාංකකරණය යනු සංකීර්ණ වූ ද, සාමස්තික වූ ද, පද්ධතික වූ ද ප්‍රපංචයකි. මෙහි දී අපගේ මූලික අරමුණ වන්නේ මෙම සංඛ්‍යාංකිත ප්‍රපංචය මානව සමාජ පරිණාමයේ නව මට්ටමක්, තලයක් හා ගුණයක් ලෙස තේරුම් ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ න්‍යායික, සංකල්පීය සහ ක්‍රමවේද ප්‍රවේශයක් සාකච්ඡා කිරීමට ප්‍රයත්න දැරීමක් වේ.

දැනට මෙම නව ප්‍රපංචය අවබෝධ කර ගැනීම සඳහා තාක්ෂණික නියතවාදී ප්‍රවේශය, දේශපාලන ආර්ථික විද්‍යාත්මක ප්‍රවේශය, ප්‍රේක්ෂකාගාර ගවේෂණ ප්‍රවේශය, මාධ්‍ය ආර්ථික විද්‍යාත්මක ප්‍රවේශය ආදිය ගෙනහැර දැක්විය හැකි ය. මේ සෑම ප්‍රවේශයක් ම සංඛ්‍යාංකකරණය හෝ සංඛ්‍යාංක ප්‍රපංචය පිළිබඳ ව පාර්ශ්වීය හෝ ආංශික පැතිකඩක් ඔස්සේ විග්‍රහ කර තිබීම එම ප්‍රවේශ හඳුන්වා ඇති විවිධ නාමකරණවලට අනුව ම පැහැදිලි වේ. නිදර්ශනයක් ලෙස සංඛ්‍යාංක විප්ලවය සමාජ සංස්කෘතික ක්‍රියාවලියේ පමණක් නොව, සමස්ත මානව සමාජයේ ම,

සංස්කෘතියේ ම, ශිෂ්ටාචාරයේ ම පදනම වන බව තාක්ෂණික නියතවාදී ප්‍රවේශයේ නියෝජිතයින්ගේ මූලික ආස්ථානයයි. මෙම ප්‍රවේශයේ ප්‍රධාන පුරෝගාමී න්‍යායවේදියෙකු වන මැක්ලුහන් තාක්ෂණයේ, මාධ්‍යයේ වර්ධනය සහ ශිෂ්ටාචාරයේ වර්ධනයේ මට්ටමක් අතර සෘජු සම්බන්ධතාවක් පවතින බව අවධාරණය කළේ ය. (Mcluhan, 1964) මෙම තාක්ෂණික නියතවාදයේ සංඛ්‍යාංක යුගයේ සංකල්පවේදියකු වන කැස්ටෙල්ස් පෙන්වා දෙන්නේ සමකාලීන සමාජයෙහි වැදගත් වන්නේ තොරතුරු සම්පතක් ලෙස අත්පත් කර ගැනීම නොව, තොරතුරු සංරක්ෂණයේ සහ බහුලීකරණයේ සංඛ්‍යාංක මාදිලියයි. (Castels, 2000). සංඛ්‍යාංක සන්ධාර සහ ඒවා පරිභෝජනය කිරීමේ මාදිලි එනම්, ඒවා සමඟ සිදුවන්නා වූ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය මඟින් සංඛ්‍යාංක සමාජය හැඩගැසෙන බව කාස්ටල්ස් තවදුරටත් පෙන්වා දෙන්නේ ය. සංඛ්‍යාංක රූපවාහිනිය සහ රාජ්‍ය උපයෝගිතාව ප්‍රකට කරන සංඛ්‍යාංක රූපවාහිනිය සම්බන්ධ දේශපාලන ආර්ථික විද්‍යාත්මක ප්‍රවේශයට අනුව කාර්මික සමාජයෙන් සංහතික මාධ්‍ය ක්‍රියාකාරීත්වයේ වඩාත් ම වැදගත් නිෂ්පාදනය, භාණ්ඩය මූලික සමාජ ප්‍රතිඵලය ලෙස ඉදිරිපත් වන්නේ සංහතික ප්‍රේක්ෂකාගාරය බවයි. (Pzcad, 1989, Vartanov, 2009).

සංඛ්‍යාංක රූපවාහිනිය ජීවිතයේ ශෛලියක් ලෙස ප්‍රකට කරන ප්‍රේක්ෂකාගාර ගවේෂණ ප්‍රවේශය අනුව ලිබරල් වෙළෙඳපොළ ආර්ථිකය තුළ රූපවාහිනිය පාරිභෝජන සමාජයක් නිර්මාණය කිරීමේ උපකරණයක් වශයෙන් පමණක් නොව, එය 'විශ්ව ගම්මානය' ගොඩනැඟීමේ ගාමක බලවේගයක් වශයෙන් ද ක්‍රියාකරන බව (Giddens, 1991) මෙම ප්‍රවේශය නියෝජනය කරන දෘෂ්ටිවේදීන් අවධාරණය කරයි. සිය ජාතික රාජ්‍යයන්ගේ දේශපාලනය කෙරෙහි විවේචනාත්මක ආස්ථානයක් කෙරෙහි මිනිසුන් ව තල්ලු කරමින් ගෝලීය ආර්ථික, දේශපාලන සහ සංහතික මාධ්‍ය ආයතනයන්ගේ බලපෑමට යටත් ව සිදුවන සමකාලීන ගෝලීය ක්‍රියාවලිය ජාතික සහ ගෝලීය බලවේග අතර ප්‍රබල ප්‍රතිවිරෝධතා ජනනය කොට තිබේ. සාමාන්‍ය ප්‍රතිසම රූපවාහිනියේ පරිණාමයත් සමඟ වර්ධනය වූ විඛණ්ඩනික සංඛ්‍යාංක රූපවාහිනී අවධියේ දී තවත් උත්සන්න වන්නේ



ප්‍රතිසම අවධියේ දී සියලු නාලිකා විඛණ්ඩණීකරණය අභිබවා වැඩසටහන්, ප්‍රභේදන මට්ටම සහ ඒවායේ වෙන් වෙන් කොටස් පවා විඛණ්ඩනීකරණයට ලක් කරයි. මේ අනුව සංඛ්‍යාංක යුගයේ දී රූපවාහිනී ප්‍රේක්ෂකාගාරයේ විඛණ්ඩනීකරණය ප්‍රබල ප්‍රවණතාවක් ලෙස සැලකිය හැකි ය. එම ප්‍රවණතාව විතැන් කාල සහ විතැන් අවකාශ ස්වරූප දක්වා වර්ධනය වී ඇත. විඛණ්ඩනීය රූපවාහිනී ප්‍රේක්ෂකාගාරය විසරණිත තත්ත්වයක් දක්වා පරිවර්තනය වෙමින් රූපවාහිනී ප්‍රේක්ෂකයා ඕනෑ ම වේලාවක ඕනෑ ම රූපවාහිනී වැඩසටහනක හෝ ප්‍රභේදයක ප්‍රේක්ෂකාගාරයේ සාමාජිකයෙකු විය හැකි ය. සංඛ්‍යාංක බහුමාධ්‍ය වේදිකා අවකාශය තුළ විසරණීය ප්‍රේක්ෂකාගාරයක් බිහිවීම වැළැක්විය නොහැකි ප්‍රවණතාවකි.

සංඛ්‍යාංක යුගයේ දී රූපවාහිනී වැඩසටහන් සන්නාම බවට පත්වීම පිළිබඳ මාධ්‍යාර්ථික විද්‍යාත්මක ප්‍රවේශය පෙන්වා දෙයි. සංඛ්‍යාංක රූපවාහිනියේ ආගමනයත් සමඟ ම රූපවාහිනී වෙළෙඳපොළේ ප්‍රතිමාන සහ රීති වෙන් වන අතර, නව ප්‍රතිමාන සහ රීතිවලට අනුකූල ව වෙළෙඳපොළේ රූපවාහිනී සාම්ප්‍රදායික වැඩසටහන් සහ ප්‍රභේදවල උපාය මාර්ග පිළිබඳ යළි සිතා බැලිය යුතු ය. සංඛ්‍යාංක යුගයේ දී ක්‍රියාත්මක වන අති විශාල රූපවාහිනී නාලිකා ප්‍රමාණය තුළ ප්‍රේක්ෂකයා දක්වා ඒ හෝ මේ වැඩසටහන හෝ ප්‍රභේදය සමීප කිරීමේ දී නාලිකාවල හෝ රූපවාහිනී මධ්‍යස්ථානවල හෝ වැදගත්කමට වඩා ඒ ඒ වැඩසටහන්වල හෝ ප්‍රභේදවල සන්නාමවල බලපෑම වැදගත් වන්නේ ය. බොහෝ පර්යේෂකයින් පෙන්වා දෙන්නේ වර්තමාන රූපවාහිනී ප්‍රේක්ෂකයා රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කරන්නේ තමා බලන වැඩසටහන කුමක් ද යන්න පිළිබඳ පූර්ව ආකල්පයකින් තොර ව අහඹු ලෙස බව ය (Hujanen, 2002).

සංඛ්‍යාංක රූපවාහිනිය පිළිබඳ ව අප ඉහත ගෙන හැර දක්වන ලද න්‍යායික සංකල්පීය ක්‍රමවේද මූලික වශයෙන් එම සංකීර්ණතා පිළිබඳ වෙන් වෙන් ව සලකා බලා ඇති අතර ඒවා බොහෝ විට තාක්ෂණික හෝ ආර්ථික හෝ ප්‍රේක්ෂක හෝ කේන්ද්‍රයික ව සීමා වී ඇති බව පෙනේ. නමුත් සංඛ්‍යාංක සංස්කෘතිය, සංඛ්‍යාංක රූපවාහිනිය සමස්ත සමාජ පරිණාම ක්‍රියාවලියේ ම සංයුක්ත, අවියෝජනීය කොටසක් ලෙස තේරුම් ගැනීමට ආධාරක වන

න්‍යායික සංකල්පීය සහ තාර්කික ක්‍රමවේදයක් සකස්කර ගැනීම ඉතා ම වැදගත් ය. සමකාලීන සමාජ සන්දර්භයෙන් වියුක්ත ව ගෙන සංඛ්‍යාංකකරණය පිළිබඳ සංකල්පීය පරිගත ගොඩනැඟීම විද්‍යානුකූල නොවේ. එය අද්‍යතන සමස්ත සමාජ ක්‍රියාවලියේ හා පරිණාමයේ එක් තලයක්, එක් මට්ටමක් සහ ගුණ සම්බන්ධතා සමස්තයක් ලෙස සලකා සංකල්පීයකරණය ආරම්භ කළ යුතු වන්නේ ය. ඒ සඳහා තාර්කික සංහිත මාධ්‍යවේද අධ්‍යයන ප්‍රවේශයක් සකසා ගත යුතු බව අපගේ අදහස ය. ඊට අදාළ න්‍යායික, සංකල්පීය, තාර්කික සහ ක්‍රමවේදී අවබෝධතා පද්ධතිය සැකසීම වෙනත් බරපතල කාර්යයක් බැවින් මේ අධ්‍යයනයේ සීමාවට එය ඇතුළත් කිරීම ප්‍රායෝගික නොවන්නේ ය.

නමුත්, සංඛ්‍යාංක සංස්කෘතිය සහ සංඛ්‍යාංක විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය අවකාශ අද්‍යතන සමාජ පාලනයේ සහ පරිණාමයේ ප්‍රමුඛ ආයතනයක් ලෙස එය අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ පොදු සංකල්පීය සහ ක්‍රමවේදී රාමුවක් මෙහා හැර දැක්වීම සුදුසු යැයි සිතමු.

මෙහි දී අපගේ විශේෂ අවධානය යොමු වන්නේ රූපවාහිනී මාධ්‍ය සංහිත මාධ්‍යයක් වශයෙන් සිය ඓතිහාසික පරිණාමයේ දී එය සමාජ සහ මානව යථාර්ථය ඉදිරිපත් කිරීමේ දී ප්‍රකට කරන ලද විශේෂතා විමර්ශනය කිරීමත්, එය සංහිත පාලනයේ හා මෙහෙයවීමේ උපකරණයක් ලෙස රූපවාහිනියේ සමකාලීන ශක්‍යතා හා ප්‍රවණතා අධ්‍යයනය කිරීමත් කෙරෙහි ය.

පසුගිය සියවසකට ආසන්න කාලය තුළ රූපවාහිනිය එක අතකින් විද්‍යා-තාක්ෂණික සොයා ගැනීම්වල සහ ජයග්‍රහණවල පිහිටෙන් යාන්ත්‍රික (කළු-සුදු හා වර්ණ) රූපවාහිනියේ සිට විද්‍යුත් රූපවාහිනිය දක්වා ද එසේ ම සංඛ්‍යාංකිත රූපවාහිනිය දක්වා ද තාක්ෂණික වශයෙන් ගමන් කර ඇති අතර, අනෙක් අතින් නිර්මාණාත්මක-කලාත්මක අත්දැකීම්වල සහ සොයාගැනීම්වල ආධාරයෙන් රූපවාහිනිය සරල පරාවර්තනයෙහි වූ සදෘශතාවේ සිට යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමෙහි වකාර්රූපීතාව දක්වා වූ ගමනය ප්‍රකට කරයි. සමස්තයක් වශයෙන් රූපවාහිනිය සිය ඉතිහාසය තුළ ඒ ඒ



අවධිවල දී බාහ්‍ය යථාර්ථය ඉදිරිපත් කිරීමේ විශේෂතා ප්‍රකට වන්නේ අදාළ තාක්ෂණික ශක්‍යතා මත පමණක් ම නොව, ඊට රූපවාහිනිය ක්‍රියාත්මක සමාජ හැකියාව ද බලපානු ලැබේ. 'මාධ්‍යයන්ගේ ඓතිහාසික පරිණාමයත් සමග ම එම මාධ්‍යයන් මගින් යථාර්ථය පරාවර්තනය කිරීමේ මාදිලිය, ස්වරූපය, වෙනස් වූ අතර, යථාර්ථයේ පරාවර්තනය ක්‍රමානුකූල ව අදාළ යථාර්ථයෙන් විස්ථාපනය වීමේ ප්‍රවණතාව මාධ්‍ය සංස්කෘතියේ වර්ධනයේ ඓතිහාසික ප්‍රවණතාවක් වශයෙන් ක්‍රියාත්මක වේ. (වීරසිංහ, 2015) වර්තමානයේ දී රූපවාහිනිය යථාර්ථය ඉදිරිපත් කිරීමේ සක්‍රිය සහයෙකුගේ භූමිකාවේ සිට යථාර්ථය සමග තරග කරන තරගකරුවෙකුගේ භූමිකාව පවා අතික්‍රමණය කරමින් අද්‍යතන රූපවාහිනිය යථාර්ථයට එරෙහි ව ක්‍රියාකරන උපකරණයක් බවට පරිවර්තනය වී ඇති බව පෙනේ. මේ තත්ත්වය සමකාලීන මානව සහ සංස්කෘතික සත්තාවේ ජනනය කෙරෙහි බලපාන සැලකිය යුතු සාධකයක් බවට පත්ව තිබේ.

මේ අනුව රූපවාහිනියේ ඓතිහාසික පරිණාමය තුළ එය යථාර්ථයට දක්වන සම්බන්ධතාව සහ ඊට බලපාන වෙනත් සාධක පිළිබඳ ව අවබෝධයක් ඇතිකර ගැනීම සඳහා සමස්ත රූපවාහිනිය තාක්ෂණික සහ සංස්කෘතික ප්‍රපංචයක් වශයෙන් එහි ඉතිහාසය තුළ නිලීන අනොන්‍යාත්මක ප්‍රතිවිරෝධතාව වටහාගත යුතු ය.

රූපවාහිනිය තාක්ෂණික සංස්කෘතික ප්‍රපංචයක් ලෙස වර්ධනයේ දී එකිනෙකට පරස්පර, ප්‍රතිවිරෝධී ප්‍රවණතා දෙකක් වර්ධනය වන බව පෙන්වාදිය යුතු ය. එම ප්‍රතිවිරෝධාත්මක ප්‍රවණතා දෙක වර්ධනය වන්නේ රූපවාහිනිය යථාර්ථයට දක්වන සම්බන්ධතාවට අදාළව ය. එක් අතකින් රූපවාහිනියේ වර්ධනය නිසා සැබෑ ලෝකයේ සැබැවින් ම සිදුවන සිද්ධි පිළිබඳ ව පුළුල් සංජානනයක් ඇති කර ගැනීමේ හැකියාව ප්‍රසාරණය කරන්නේ ය. පුද්ගලයාට සජීව ලෙස ම තමාට සමීප නැති සිද්ධි පවා ග්‍රහණය කර ගැනීමේ හැකියාව ලැබී ඇත. අනෙක් අතින් සමකාලීන රූපවාහිනියේ අතිප්‍රබල නිරූපණ සහ ප්‍රකාශන හැකියාව නිසා යථාර්ථය විකරණය කිරීමේ, විකෘති කිරීමේ සහ ව්‍යාජීකරණය කිරීමේ හැකියාව ද ප්‍රබල ලෙස වර්ධනය වී ඇත.

විශේෂයෙන් ම මේ තත්ත්වයන් සමග සිය අවසාන ලක්ෂය කරා ළඟා වෙමින් පවතී.

සංඛ්‍යාංක යුගයේ දී රූපවාහිනියේ ශ්‍රව්‍ය දෘශ්‍ය පරාවර්තනයේ පරාමිතින් ස්වාභාවික සීමා අතික්‍රමණය කරන්නේ ය. 'ඩිජිටල්' (සංඛ්‍යාංක) ශ්‍රව්‍ය ද ස්වභාවික ලෝකයේ දී හමු නොවේ. ශ්‍රව්‍ය ස්වාභාවික ව හැමවිට ම 'ඇනලොග්' (ප්‍රතිසම) සංඥාවක් ලෙසින් පවතී. (හෙට්ටිආරච්චි 2014) මේ තත්ත්වය මානවවේදී රූප දර්ශන සංජානනයේ සිට පශ්චාත් මානවවාදී රූප දර්ශන සංජානනයක් දක්වා වූ මට්ටමක් සනිටුහන් කරන්නේ ය.

මීට අමතර ව ලෝක සංස්කෘතික අවකාශය තුළ රූපවාහිනිය ඉටුකරනු ලබන ද්විත්ව භූමිකාව පදනම් කොට එක් අතකින් සාර්වභෞමිකකරණය ද අනෙක් අතින් ජාතිකවාදීකරණය ද වර්ධනය වන බව පෙනේ.

මේ අනුව රූපවාහිනියේ තාක්ෂණික වර්ධනය මෙන් ම එහි සංස්කෘතික වර්ධනය වර්තමානය වන විට නව මානව, නව සමාජ තත්ත්වයක්, මට්ටමක්, මානයක් බිහිකර තිබේ. එය අපි පශ්චාත් හෝ උපරි රූපවාහිනී තත්ත්වයක් ලෙස හඳුන්වමු. සමකාලීන රූපවාහිනිය මේ තත්ත්වයට පත්වීම සඳහා මූලික සාධක දෙකක් බලපා තිබේ. විද්‍යා තාක්ෂණික වර්ධනය හේතුකොට ගෙන, සංඛ්‍යාංක තාක්ෂණයේ පරිගණක සහ රූපවාහිනිය සංශ්ලේෂිකරණය වීම, අන්තර්ක්‍රියාකාරී රූපවාහිනිය බිහිවීම, රූපවාහිනී නාලිකා බහුලීකරණය වීම, නිරූපණ හා ප්‍රතිරූප වෙනස් කිරීමේ හැකියාව උපරිම ලෙස වර්ධනය වීම, ආදී ප්‍රපංච හා ප්‍රවණතා පළමු සාධකයට අයත් අතර දෙවැනි සාධකය වන්නේ මානව සමාජ පරිණාමය උපරි සමාජයක් බව පරිවර්තනය වීම හේතුකොට ගෙන, ලිබරල්කරණය, පශ්චාත් නූතනකරණය, සංහතිකකරණය, ප්‍රතෙස්තීකරණය ආදී ප්‍රපංච හා ප්‍රවණතා දෙවැනි සාධකයට ඇතුළත් වන්නේ ය. සමකාලීන රූපවාහිනී පඨිත මඟින් නිරූපිත ප්‍රතිරූපීය රූපකවල වෙනස්වීම එක් අතකින් රූපවාහිනී තාක්ෂණයේ පරිණාමය මත ද අනෙක් අතින් රූපවාහිනිය රූපක විකේතීකරණය කිරීමේ හා ඒවා සංජානනයේ හා අර්ථකථනය කිරීමේ පුද්ගල හැකියාව මත ද



රඳා පවතී. මානව වර්ගයාගේ සමාජ පරිණාමය වර්තමානය වන විට උපරි සමාජයක් දක්වා ගමන් කර තිබේ. මානව වර්ගයා සිය ඉතිහාසය තුළ පූර්ව සමාජය, සමාජය සහ උපරි සමාජය දක්වා වූ යුග ත්‍රිත්වයක් ඔස්සේ පරිණාමය වී, අද්‍යතනය වන විට උපරි සමාජ යුගයට අවතීර්ණ වී සිටී. "මෙම සමාජ පරිණාමීය ක්‍රියාවලියට සමගාමී ව මානව වර්ගයාගේ දෘශ්‍ය සංස්කෘතික පරිණාමය ද ගමන් කර ඇති බව අපගේ අදහසයි. (වීරසිංහ 2015).

මානව ඉතිහාසයේ දෘශ්‍ය සංස්කෘතික සහ දෘශ්‍ය සන්නිවේදනයේ වැදගත් සන්ධිස්ථාන ලෙස චිත්‍ර කලාව, ඡායාරූප කලාව, සිනමාව සහ රූපවාහිනිය සඳහන් කළ හැකි ය. සමකාලීන සිනමාව සහ රූපවාහිනිය මානවයාගේ දෘශ්‍ය සංස්කෘතියේ සහ දෘශ්‍ය සන්නිවේදනයේ පරිණාමයේ අවසාන ලක්ෂය සනිටුහන් කරන්නේ ය. වර්තමානයේ දී සංඛ්‍යාංක තාක්ෂණය පාදක මානව විඥාපන සංස්කෘතිය සහ සන්නිවේදන සංජානනයේ මානවවේදීය, මානවවිද්‍යාත්මක සීමා මෙන් ම සංස්කෘතිකවේදය සහ සංඥාර්ථවේදීය සීමා අතික්‍රමණය කොට ඇත. මෙය උපරි සමාජයෙහි උපරි මානසිකත්ව, දෘෂ්ටිවාදී ක්ෂේත්‍රයක් ගොඩනැගීම සමඟ ඍජු ලෙස ම සම්බන්ධ වේ.

විශේෂයෙන් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සංස්කෘතියේ සහ සන්නිවේදනයේ වඩාත් ම සංහතිකකරණයට ලක්වී ඇති රූපවාහිනී මාධ්‍ය එහි මූලික යුගයේ දී සමාජ යථාර්ථය සදෘශ්‍ය ලෙසට පරාවර්තනය කරමින් ද, මධ්‍ය යුගයේ දී යථාර්ථය විකරණාත්මක ලෙසට නිරූපණය කරමින් ද, එහි පරිණත (උපරි) යුගයේ දී යථාර්ථය ප්‍රතිනිර්මාණය කරමින් ද සමස්ත රූපවාහිනියේ ඉතිහාසය තුළ දී යථාර්ථය තුළ, මට්ටම් ත්‍රිත්වයකින් ගෙන හැර දැක්වීමට සමත් වී ඇත.

වර්තමානයේ සංඛ්‍යාංක තාක්ෂණික ක්‍රමවේද භාවිතය රූපවාහිනියෙහි පමණක් නොව, සියලු ම විඥාපන, සන්නිවේදන සහ නිරූපණ මාධ්‍ය සඳහා යොදා ගන්නේ ය. එනම්, එය සමස්ත මානව සංස්කෘතියට ම අදාළ වන්නේ ය. සංහතික මාධ්‍යයේ ස්වරූපයක් වශයෙන් සංඛ්‍යාත රූපවාහිනියේ වර්ධනය සහ ව්‍යාප්තිය රූපවාහිනී ප්‍රේක්ෂකයා කෙරෙහි බලපාන ආකාරය

පූර්ව සංඛ්‍යාංක රූපවාහිනියේ බලපෑමට වඩා ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මක ව අලුත් තත්ත්වයක් උදා කරන්නේ ය. එය මානව සහසංහතික පාලනයේ, නියාමනයේ මෙහෙයවීමේ පශ්චාත් දෘෂ්ටිවාදී, පශ්චාත් ආධ්‍යාත්මික, පශ්චාත් දේශපාලනික ප්‍රබල උපකරණයක් බවට පත් වන්නේ ය.

සංඛ්‍යාංක රූපවාහිනියේ විශේෂයෙන් ම සංඛ්‍යාංක රූපවාහිනී පඨිත නිර්මාණයේ මූලික ම ඒකකය වශයෙන් ඉදිරිපත් වන්නේ 'සංඛ්‍යාංකික සංශ්ලේෂී රූපක' වන අතර, සංඛ්‍යාංකික සංශ්ලේෂිය රූපක සංඛ්‍යාංක යුගයේ රූපවාහිනියේ පමණක් නොව, සියලු ම නිර්මාණ සඳහා පාදක වන අමුද්‍රව්‍ය බවට පත් වන්නේ ය. මෙම නිර්මාණ තවදුරටත් පෙර මෙන් යථාර්ථයේ පරාවර්තනයක් හෝ නිරූපණයක් හෝ ප්‍රතිනිර්මාණයක් හෝ නොවන අතර එය යථාර්ථයට කිසිම සම්බන්ධතාවක් නැති 'සංඛ්‍යාංකික සංශ්ලේෂිය රූපක' විවිධාකාර ලෙස සංයෝජනය කරමින් නිර්මාණය කරන පඨිත විශේෂයකි. මේ අනුව සංඛ්‍යාංක යුගයේ දී ඡායාරූපය, රූපවාහිනිය ආදී යථාර්ථය ඉදිරිපත් කිරීමේ සියලු මාධ්‍යයන්ගේ භූමිකාව උඩු යටිකුරු වෙමින් පශ්චාත් යථාර්ථයක් නිර්මාණ වන අතර, එය උපරි සමාජ පශ්චාත් තත්ත්ව සමග සමගාමී වන බව අපගේ මුඛ්‍ය අදහසයි. උපරි සමාජ යුගයේ දී මාධ්‍ය රාජ්‍යකරණය වන අතර, රාජ්‍ය මාධ්‍යකරණය ද වන්නේ ය. (වීරසිංහ 2016) උපරි සමාජ යුගයේ දී සංඛ්‍යාංක ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදන, නිරූපණ, ප්‍රාසංගික පඨිත සමාජයෙහි මානසිකත්ව සහ දෘෂ්ටිවාදී පැතිකඩ නිර්මාණය කිරීමේ මූලික මාදිලිය බවට පත් වන්නේ ය.

මේ අනුව බලන විට අපට පෙනී යන්නේ, මානව ඉතිහාසයෙහි සමාජ පරිණාමයේ සෑම අවධියක දීම ඊට අදාළ, සරිලන මානසිකත්ව සහ දෘෂ්ටිවාදී ස්වරූප සහ ඒවා සමාජගත කරන යන්ත්‍රණයක් ද නිර්මාණය කරන බවයි. ඒ අනුව සංඛ්‍යාංක රූපවාහිනිය යනු උපරි සමාජයෙහි පශ්චාත් මානව සහ උපරිසංහතික පාලනයේ මූලික යාන්ත්‍රණය බව අපගේ අදහසයි.



පරිශීලිත ග්‍රන්ථ


1. Card R. (1989) Media Economics, London, Sage Publication
2. Vartanova E.L. (2009) Fundomentals of Media Business Moscow, Aspect-Press
3. McLuhan M (1964) Understanding Media; The Extentions of Man. New York; Mcgraw Hill.
4. Castels M (2000) The Information Age; Economics, Society and Culture, Oxford, Blackwell
5. Grddens, A. (1991) Modernity and Self Identity; Self and Society in the Late Modera Age; Cambridge: Polity
6. Hujanen, T. (2002) The Power of Schedule Programme Management in the Transformation of Finish Public Service Television. Tampere University Press
7. වීරසිංහ ටියුඩර් (2015) පශ්චාත් සාංග්‍රාමික ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ මාධ්‍ය සංස්කෘතිය, සමාජ සහ සංහතික පාලනයේ නව උපකරණයක් ලෙස ජනමාධ්‍යවේදය, ජනමාධ්‍ය අධ්‍යයන සහ විචාර, මාධ්‍ය සංස්කෘතිය, සංස්. ධර්මකීර්ති ශ්‍රී රන්ජන්, වෙළුම 5., මාධ්‍ය පර්යේෂණ අංශය, ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
8. හෙට්ටිආරච්චි ස්ටැන්ලි (2014) ඩිජිටල් ටෙලිවිෂන් සම්ප්‍රාප්තිය ANCL Commercial Printing Department, කොළඹ
9. වීරසිංහ, ටියුඩර් (2015) සමාජ යථාර්ථය නිර්මාණය කිරීමෙහිලා ඡායාරූපයේ සමකාලීන භූමිකාව හරවන ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය - ආරාධිත දේශනය, කැලණිය විශ්වවිද්‍යාලය
10. වීරසිංහ ටියුඩර් (2016) සිවමාන ජාතික සහ ගෝලීය ප්‍රවණතා පිළිබඳ විචාරත්මක පර්යාලෝක - තෝතැන්න ප්‍රකාශන, ආණමඩුව.



ආචාර්ය ටියුඩර් වීරසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ශ්‍රීපාලි මණ්ඩපය,
කොළඹ විශ්වවිද්‍යාලය.